# දිවිනැගුමට - ගමේ ඉතුරුම්

දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව

දිවිනැගුම ප්‍රජාමූල බැංකු ණය වැඩ සටහන

දිවිනැගුම චක්‍රලේඛ අංක **07**


ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය

දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව

**24/4** කාසල් වීදිය,

කොළඹ **08.**

**0112-696592**

## දිවිනැගුම චක්‍ර ලේඛ  අංක : 2014/07

දිවිනැගුම ප්‍රජාමූල බැංකු කළමනාකරුවන්,

දිවිනැගුම ප්‍රජාමූල බැංකු සමිති කළමනාකරුවන්

## "දිවිනැගුමට - ගමේ ඉතුරුම්"

### දිවිනැගුම ප්‍රජා මූල බැංකු හා දිවිනැගුම ප්‍රජා මූල බැංකු සමිති මගින් ක්‍රියාත්මක

### ක්ෂුද්‍ර මූල්‍ය ණය වැඩසටහන

**1. හැඳින්වීම.**

මහින්ද චින්තන ජාතික ප්‍රතිපත්තිය ක්‍රියාවට නංවමින් 2013 අංක 01 දරණ දිවිනැගුම පනත මගින් දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව2014 ජනවාරි 03 දින සිට විශේෂ ගැසට් නිවේදනයකින් ස්ථාපිත කර ක්‍රියාත්මක කරන්නට යෙදුනි.

ඒ අනුව මෙතෙක් ක්‍රියාත්මක වූ සමෘද්ධි බැංකු සංගම් හා සමෘද්ධි මහ සංගම් ජාලය දිවි නැගුම  සංවර්ධන දෙපාර්තමේන්තුවේ සෘජු අධික්ෂණයට හා පාලනය යටතට පත් කරන ලදී.  ඒ අනුව සමෘද්ධි බැංකු සංගමය දිවිනැගුම ප්‍රජා මූල බැංකුව ලෙසත්, සමෘද්ධි මහා සංගමය දිවි නැගුම ප්‍රජා මූල බැංකු සමිතිය ලෙසත් ක්‍රියාත්මක වනු ඇත.

ශ්‍රී ලාංකික ජන සමාජය තුල දශක දෙකකට පෙර පැවැති 30% කට ආසන්න වූ දිළිඳුකම මේ වන විට 6% ක මට්ටමට ගෙන ඒමට දායක වූ සමෘද්ධි වැඩසටහන 2005 වර්ෂයෙන් පසුව මහින්ද චින්තන ප්‍රතිපත්ති ප්‍රකාශය අනුව දිවිනැගුම ජාතික වැඩසටහන ලෙස ගම් නියම්ගම් කරා පැතිරගොස් ආර්ථික සංවර්ධන ක්‍රියාවලිය ප්‍රවර්ධනය කරමින් දිළිඳුබව තුරන් කිරීමේ හා සමාජ සාධාරණත්වය සහතික කිරීමේ ජාතික ප්‍රතිපත්තිය බලාත්මක කිරීමේහිලා පුද්ගලයා පවුල හා කණ්ඩායම කේන්ද්‍රකරගත් ක්ෂුද්‍ර මූල්‍ය වැඩ සටහන ලෙස ඉදිරියටත් ක්‍රියාත්මක වනු ඇත.

**2. දිවිනැගුම ජාතික සංවර්ධන වැඩසටහන.**

දිවිනැගුම ජාතික සංවර්ධන වැඩසටහන යටතේ ජීවනෝපාය හා සමාජ සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම තුලින් පුද්ගලයා, පවුල හා ගම දියුණු මට්ටමට ඉහළ නැංවීම අපේක්ෂා කෙරේ.

මේ සඳහා ක්ෂුද්‍ර මූල්‍ය වැඩසටහන් උපකාරක සේවාවක් වශයෙන් දායකත්වය ලබාදිය යුතුවේ.  මෙහිදි දිවිනැගුම ප්‍රජා මූල බැංකුව විසින් දිවිනැගුම ප්‍රතිලාභින්ට ණය ලබාදීම හා ඔවුන්ගේ ඉතිරි කිරීම් ප්‍රවර්ධනය කිරීම සඳහා පහත දැක්වෙන මඟපෙන්වීම් යටතේ බැංකු පද්ධතිය ක්‍රියාත්මක කිරීමට කටයුතු කිරීම මැනවි.

**3. පරමාර්ථ.**

දිවිනැගුම ජාතික වැඩසටහනට සමගාමීව ක්‍රියාත්මක දිවිනැගුම ප්‍රජා මූල බැංකු ජාලයෙහි පරමාර්ථය වන්නේ,

i. දිවිනැගුම ප්‍රතිලාභීන්ගේ ඉතිරි කිරීම් පුරුද්ද ප්‍රවර්ධනය කිරීම හා ඒ සඳහා උනන්දු කරවීම.

ii. දිවිනැගුම ප්‍රජාමූල බැංකු ජාලය මඟින් දිවිනැගුම ප්‍රතිලාභීන් ව්‍යවසායකයන් ලෙස හඳුනාගනිමින් ඔවුන්ගේ ආයෝජන හැකියාව වැඩි දියුණු කිරීම හා හදිසි මූල්‍ය අවශ්‍යතා පිරිමැසීම.

iii. දිවිනැගුම ප්‍රතිලාභීන්ගේ විභව ශක්තීන් හා දක්ෂතා හඳුනා ගනිමින් නිෂ්පාදන හැකියාව වැඩි දියුණු කිරීම මඟින් ආදායම් උත්පාදන ක්‍රියාවලිය වර්ධනය කිරීම.

iv. දිවිනැගුම ප්‍රතිලාභීන්ට පුද්ගල හා කණ්ඩායම් මට්ටමින් ණය ලබාදීම.

v. මූල්‍ය කලමනාකරණය පිළිබඳව දිවිනැගුම ප්‍රතිලාභීන් දැනුවත් කිරීම.

vi. ප්‍රතිලාභීන්ගේ සහ ඔවුන්ගේ පවුල් වල සාමාජිකයන්ගේ සුභසාධන කටයුතු තහවුරු කිරීම, විදුලිය, ජලය, නිවාස, සනීපාරක්ෂක පහසුකම් ලබාදීම.

vii. දිවිනැගුම ප්‍රතිලාභී ගනු දෙනුකරුවන් බැංකු සංස්කෘතියකට හුරු කිරීම.

**4. ඉලක්කගත කණ්ඩායම.**

දිවිනැගුම ප්‍රජා මූල බැංකු මඟින් සපයනු ලබන සේවාවන් සඳහා ඉලක්ක කර ගන්නේ දිවිනැගුම සහනාධාර ප්‍රතිලාභීන්, අඩු ආදායම්ලාභී ප්‍රජාවසහ කිසියම් මට්ටමක ජීවනෝපාය සංවර්ධනය ලඟා කරගත් එහෙත් තවදුරටත් දියුණුවීමට ඉඩ ප්‍රස්ථාව ඇති කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාවසායකයන්ය.

**5. ඉලක්ක.**

i. 2014 වාර්ෂික අයවැය ලේඛනයෙහි සඳහන් පරිදි කුඩා සහ මධ්‍යම පරිමාණ ණය පහසුකම් පසුගිය වර්ෂය තුල මුදාහල ණයට වඩා 50% කින් මෙන් දෙගුණයකින් ඉහළ නැංවීම.

ii. දිවිනැගුම ජාතික සංවර්ධන වැඩසටහන යටතේ ප්‍රාග්ධන අවශ්‍යතා ඇති පාර්ශවයන් තෝරා මූල්‍ය පහසුකම් සැලසීම මඟින් දිවිනැගුම ප්‍රජාමූල බැංකු සහ ප්‍රජා මූල බැංකු සමිති බල ප්‍රදේශ තුළ සාර්ථක ව්‍යවසායකයන් සවිබල ගැන්වීම.

iii. දිවිනැගුම ප්‍රතිලාභීන් අතරින් විවිධ ක්ෂේත්‍රයන් වන නිෂ්පාදන කටයුතු හා වගා කටයුතු සඳහා යොමු වී ඇති අයගේ නිෂ්පාදන හා එලදාව ගබඩා කිරීම, සැකසීම හා සුරක්ෂිතතාවය සඳහා අවශ්‍ය ගොඩනැගිලි හා වෙනත් පහසුකම් සංවර්ධනය සඳහා ණය ලබාදීම.

iv. දිවිනැගුම ප්‍රතිලාභීන් අතර විවිධ භාණ්ඩ හා සේවා නිෂ්පාදන කටයුතු වල යෙදී සිටින ව්‍යවසායකයන්ගේභාණ්ඩ වෙළඳපල කරා ගෙන යාමට අවශ්‍ය ජංගම අළෙවි රථ, වෑන් රථ, ත්‍රීවීලර්, යතුරුපැදි, පාපැදි මිලට ගැනීම සඳහා ණය පහසුකම් සැලසීම.

v. දිවිනැගුම ප්‍රතිලාභී පවුල් වල රැකියා අපේක්ෂාවෙන් සිටින තරුණ /තරුණියන් රජයේ හෝ ලියාපදිංචි වෘත්තිය පුහුණු ආයතනයක වෘත්තීය පුහුණුව ලබාදී, ඉන් අනතුරුව තරුණ/ තරුණියන් වෙත ස්වයං රැකියා සඳහා අවශ්‍ය භාණ්ඩ, උපකරණ හා වෙනත් පහසුකම් ලබා ගැනීමට අවශ්‍ය ණය පහසුකම් ලබාදීම සඳහා දිවිනැගුම බැංකු සහ ප්‍රජා මූල බැංකු සමිති බල ප්‍රදේශයේ තරුණ/ තරුණියන් මූල්‍ය පහසුකම්වලට යොමු කිරීම.

vi. දිවිනැගුම ප්‍රජා මූල බැංකු වැඩසටහන් යටතේ කර්මාන්තයක හෝ වෙනත් නිෂ්පාදන ක්‍රියාවලියක නියැලී සිටින, එමෙන්ම ව්‍යාපාර ආයතනය තුළින් රැකියා අවස්ථා ලබාදීමේ හැකියාව ඇති ව්‍යවසායකයන්ගේ ව්‍යාපාර ආයතනයේ වැඩි දියුණු කිරීමක් හෝ පුළුල් කිරීමේ කටයුතු සඳහා අවශ්‍ය ණය පහසුකම් ලබාදීම.

vii. දිවිනැගුම ප්‍රතිලාභ ලබන පවුල් වල ජීවන තත්ත්වය වැඩිදියුණු කිරීම සඳහා අවශ්‍ය සුභ සාධන යටිතල පහසුකම් සලසා ගැනීමට ණය පහසුකම් ලබාදීම.

- ඔවුන් පදිංචි නිවසට විදුලිය සැපයුමක් ලබා ගැනීමට අවශ්‍යාව ඇතත් ඒ සඳහා මූල්‍ය පහසුකම් නොමැති නිවාස සඳහා "විදුලි අත්වැල ණය වැඩසටහන" යටතේ ණය ලබාදීම.
- තමා පදිංචි නිවසට ජාතික ජල සම්පාදන හා ජල ප්‍රවාහන මණ්ඩලයෙන් ජල සැපයුම ලබාගැනීමට මූල්‍ය දුෂ්කරතා ඇති පවුල් සඳහා ණය පහසුකම් සැලසීම.
- පදිංචි නිවසට හෝ දැනට ඉදිකරමින් පවතින නිවසක ස්ථිර වහලක් සකස් කර උළු හෝ සෙවිලි තහඩු දැමීම, ගෙබිම සිමෙන්ති දැමීම, බිත්ති කපරාරු කිරීම, දොර ජනෙල් සකස් කර ගැනීම ආදී කටයුතු නිමකර ගැනීමට මූල්‍ය පහසුකම් නොමැති නිවාසලාභීන් සඳහා මූල්‍ය පහසුකම් සැලසීම.
- වැසිකිළි ඉදිකරගැනීම සඳහා රු.15,000/- ක ණය මුදලක් ලබාදීම.

viii. බස්නැවතුම් පළ වල, ඓතිහාසික පූජනීය ස්ථානවල හා විශේෂ ජාතික උත්සව අවස්ථාවල විවිධ භාණ්ඩ හා සේවා ජංගම වෙළඳාමේ යෙදෙන දිවිනැගුම ප්‍රතිලාභීන් තෝරා ගෙන ඔවුන්ට ක්ෂණික ණය ලබාගැනීමේ පහසුකම් සැලසීම.

ix. සංචාරක ව්‍යාපාරය තුළ කුඩා පරිමාණයෙන් කාමර පහසුකම්, ආහාරපාන හා වෙනත් සේවා සැපයීමේදී සිටින පිරිස් තෝරා ගනිමින් එම ව්‍යවසායකයන්ට ණය පහසුකම් සැලසීම.

x. දේශීය නිෂ්පාදන එකලස් කර අපනයන කටයුතු වල යෙදී සිටින දිවිනැගුම ප්‍රතිලාභීන් තෝරා ඔවුන්ට ණය පහසුකම් සැලසීම.

xi. දේශීය කර්මාන්ත සඳහා අමුද්‍රව්‍ය සැපයීමේ යෙදී සිටින මූල්‍ය දුෂ්කරතා ඇති පිරිස් තෝරා එම ව්‍යාපාර කටයුතු වැඩි දියුණු කිරීම හා තොග රැස්කිරීම වැනි අවශ්‍යතා සඳහා ණය පහසුකම් සැලසීම.

xii. දිවිනැගුම ප්‍රජා මූල බැංකු බල ප්‍රදේශය තුළ පිහිටි ලියාපදිංචි ස්වේච්ඡා සංවිධාන වල ව්‍යාපෘති කටයුතු හෝ ආදායම් උත්පාදන කටයුතු සඳහා ණය පහසුකම් සැලසීම.

xiii. ශ්‍රී ලාංකික ජනතාව අතර දියර කිරි පාරිභෝජනයප්‍රචලිත කිරීම සඳහා වැඩි දියර කිරි ප්‍රමාණයක් ලබාගත හැකි උසස් තත්ත්වයේ ගව පාලනය සඳහා අවශ්‍ය මූල්‍ය පහසුකම් ලබාදීමත්, ගවයන් සඳහා නවීන ක්‍රම යටතේ ගව ගාල් ඇති කිරීම හා තෘණ වගාව සඳහාත් දිවිනැගුම ප්‍රතිලාභීන් වෙත ණය පහසුකම් සැලසීම.

xiv. දියර කිරි එකතු කිරීමේ මධ්‍යස්ථාන ඇති කිරීම සඳහා, දිවිනැගුම ප්‍රතිලාභීන් හරහා ප්‍රජා මූල බැංකු බල ප්‍රදේශයකට මධ්‍යස්ථානයක් බැගින් පිහිටුවීමට අවශ්‍ය ණය පහසුකම් සැලසීම.

xv. සුළු අපනයන බෝග වගා කරන ප්‍රදේශවල එම වගා කටයුතු ප්‍රචලිත කිරීම හා අගය වැඩිකිරීම සඳහා ප්‍රතිලාභීන් වෙත ණය පහසුකම් සැපයීම.(උදා: ගම්මිරිස්, කොකෝවා, වැනිලා, කජු, සාදික්කා, ගොරක, පුවක් ආදි)

xvi. විදේශ හා දේශිය වෙළඳ පොල සඳහා විසිතුරු මල් වගාව හා වාණිජ මල් වගාකරුවන්ට මල් වගාවට අවශ්‍ය හරිතාගාර සකස් කර ගැනීම, වගාවන් සඳහා අවශ්‍ය අමුද්‍රව්‍ය හා පැල වර්ග ලබාගැනීමට ණය පහසුකම් සැලසීම.

xvii. අක්කර ¼ සිට අක්කර 2 දක්වා ඉඩම්වල අපනයනය උදෙසා කෘෂිකාර්මික භෝග වගා කිරීම සඳහා ණය ලබාදීම. (කෙසෙල්, අන්නාසි, රඹුටන් ආදී)

xviii. කුකුලන්, එළුවන්, ඌරන්, තාරාවන් වැනි සත්ත්ව පාලන කටයුතු සඳහා ණය ලබාදීම.

**6. ලබාගතහැකිණය.**

දිවිනැගුම ප්‍රජා මූල බැංකු හා දිවිනැගුම ප්‍රජාමූල බැංකු සමිති මගින් නිකුත් කරනු ලබන ණය.

| අනු අංකය | ණය වර්ගයන් | නිකුත් කරනු ලබන ණය මුදල | | පොලී ප්‍රතිශතය සියළුම සාමාජිකයින් සඳහා (වාර්ෂික) | ආපසු අයකිරීම් කාලය (මාස) | ආපසු ගෙවීමට දෙනු ලබන සහන කාලය (මාස) |
|---|---|---|---|---|---|---|
| | | ප්‍රථමවතාවට ණය සීමාව රු. | උපරිම ණය සීමාව රු. | | | |
| 1. | දිවිනැගුම සහන අරුණ ණය | 5,000 | 50,000 | 4% | 36 | 12 |
| 2. | ජීවනෝපාය චක්‍රීය අරමුදල් ණය | 50,000 | 75,000 | 5% | 48 | |
| 3. | ජීවනෝපාය සංවර්ධන ණය<br>i. ධීවර සංවර්ධන ණය.<br>ii. අලෙවි හා සේවා කටයුතු.<br>iii. කර්මාන්ත හා ව්‍යවසාය සංවර්ධන ණය.<br>iv. පශු සම්පත් හා සත්ත්ව පාලනය. | 50,000 | 500,000 | 8% | 72 | |
| 4. | සමාජ සංවර්ධන ණය<br>i. නිවාස ඉදිකිරීම - අළුත්වැඩියා කටයුතු.<br>ii. ඉඩම් කොටසක් මිලදී ගැනීමට.<br>iii. වැසිකිළි පහසුකම්<br>iv. ජල සම්බන්ධතා ලබාගැනීම.<br>v. විදුලි සම්බන්ධතා ලබාගැනීම. (විදුලි අත්වැල) | 50,000<br>-<br>15,000<br>25,000<br>40,000 | 300,000<br>300,000<br>-<br>-<br>- | 8% (i–iii)<br>9% | 60 (i–iii)<br>24 | |
| 5. | යොවුන් දිරිය (වෘත්තීය පුහුණුලාභී තරුණ/ තරුණියන් සඳහා වෘත්තිය පාඨමාලා ගාස්තු / උපකරණ ලබාගැනීම.) | 50,000 | 500,000 | 8% | 60 | |
| 6. | රටවිරු ජීවනෝපාය ණය | 50,000 | 500,000 | 8% | 60 | |
| 7. | හදිසි ව්‍යාපාරික ණය (ක්ෂණික) | 5,000 | 15,000 | 8% | 18 | |
| 8. | ආපදා ණය | 5,000 | 15,000 | 8% | 18 | |
| 9. | පාරිභෝගික ණය | 5,000 | 15,000 | 8% | 18 | |
| 10. | රටවිරු නිවාස ණය | 300,000 | 300,000 | 9% | 60 | |
| 11. | කෘෂිකාර්මික ණය (වගා කටයුතු, අස්වනු නෙලීම, කෘෂිකාර්මික උපකරණ මිලට ගැනීම) අස්වනු ගබඩා කිරීම. | 50,000 | 500,000 | 8% | 72 | 6 |
| 12. | දිවිනැගුම ඉසුර (දිවිනැගුම ප්‍රජා මූල බැංකු සමිතිය මගින් නිකුත් කරනු ලබන මෙම ණය මුදල ව්‍යාපෘතිවල ප්‍රාග්ධනමය අවශ්‍යතා සඳහා නිකුත් කරනු ඇත. | 500,000 | 1000,000 | 10% | 84 | |

**සටහන :-**

එක් එක් ණය වර්ග යටතේ ණය නිකුත් කිරීමේදී ආරම්භක ණය සීමාව රු. 50,000/- ලෙස දක්වා ඇත්තේ පළමු වරට ණය ලබාගන්නා ප්‍රතිලාභියකු වෙත ලබාගත හැකි ණය මුදල වන අතර, එම ණය මුදල ගෙවා අවසන් වූ පසුව ඊළඟට ලබාගත හැකි ණය සීමාවන් සඳහා යොමුවීම තුලින් ප්‍රතිලාභියාට ණය පහසුකම් ලබාගැනීම අවස්ථාව සැලසෙනු ඇත.

ණය මුදල හි ප්‍රමාණය අනුව, ආපසු අයකර ගැනීමේ කාලසීමාවන් පහත දැක්වේ.

| ණය මුදල් සීමාව (රු.) | වාරික සංඛ්‍යාව (මාසික) |
|---|---|
| 50,000/- ට අඩු | 36 |
| 50,001/- සිට 100,000/- | 48 |
| 100,001/- සිට 150,000/- | 48 |
| 150,001/- සිට 200,000/- | 60 |
| 200,001/- සිට 250,000/- | 60 |
| 250,001/- සිට 300,000/- | 60 |
| 300,001/- සිට 500,000/- | 72 |
| 500,001/- සිට 1,000,000 | 84 |

- කෘෂි කාර්මික කන්න වගාවන් සඳහා උපරිම මාස 6 ක් වන අතර, වගාවේ ස්වාභාවය අනුව ආපසු ගෙවීමේ කාලය බැංකු කළමනාකරු තිරණය කළ යුතුය.

**6.1 ණය තොරතුරු සඳහා මඟ පෙන්වීම.**

ඉහත අංක 6 ඡේදය යටතේ දක්වා ඇති ණය යෝජනා ක්‍රමයන්සඳහා දිවිනැගුම ප්‍රජා මූල බැංකු හා දිවිනැගුම ප්‍රජා මූල බැංකු සමිතිය මඟින් ණය පහසුකම් සැලසීමේ දී පහත දක්වා ඇති ව්‍යාපෘති සඳහා ප්‍රතිලාභී කණ්ඩායම් වෙත ණය ලබාගැනීමට පහසුකම් සලසා ඇත.

**01. ජීවනෝපාය සංවර්ධන ණය.**

- **ධීවර සංවර්ධන ණය.**

  මේ යටතේ ධීවර කර්මාන්තයේ යෙදී සිටින ප්‍රතිලාභීන්ගේ දැල් ආම්පන්න, ධීවර උපකරණ මිලට ගැනීම හා ධීවර බෝට්ටු අලුත්වැඩියාව, අමතර කොටස් මිලට ගැනීම, මාළු අළෙවිය සඳහා වෙළඳසැල් ඉදිකිරීම, පාපැදි හා අළෙවි පෙට්ටි ආදී උපකරණ ලබාදීම, ශීතාගාර හා ගබඩාපහසුකම් සැලසීමත් ධීවර කර්මාන්තයේදී අවශ්‍ය වන්නා වූ වෙනත් අවශ්‍යතා වෙනුවෙන් ණය පහසුකම් ලබාදීමට හැකියාව ඇත.

- **අළෙවි හා සේවා කටයුතු සඳහා ණය.**

  මෙහි දී සිල්ලර වෙළඳාම, ජංගම වෙළඳාම, සති පොළ හා ජංගම අළෙවිකුටි ඉදිකිරීම, භාණ්ඩ ප්‍රවාහනය සඳහා පාපැදි, යතුරු පැදි, ත්‍රීවිලර් රථ හා මෝටර් වැන් රථ මිලදී ගැනීම සඳහා මූල්‍ය පහසුකම් සලසනු ඇත.

- **කර්මාන්ත හා ව්‍යවසාය සංවර්ධන ණය.**

  මේ යටතේ පාරම්පරික කර්මාන්ත, ආහාර සැකසීම, ආහාර ද්‍රව්‍ය/ කුළුබඩු, පැකට් කිරීම, ගෘහආශ්‍රිත කර්මාන්ත, ආහාර කල්තබා ගැනීමේ ව්‍යාපෘති, කුඩා හා මධ්‍යපරිමාණයේ කර්මාන්ත ආරම්භ කිරිම හා දැනට පවතින කර්මාන්ත වැඩි දියුණු කර ගැනීමටත් එක් එක් ප්‍රදේශ වලට විශේෂිත වූ කර්මාන්ත සඳහා අවශ්‍ය ණය පහසුකම් සලසනු ඇත.

- **පශු සම්පත් හා සත්ත්ව පාලනය.**

කිරි හා කිරි ආහාර නිෂ්පාදනයට අවශ්‍ය ගවයන් මිලදී ගැනීම, ගවගාල් සකස්කිරීම හා කුකුල් පාලනය, එළුවන් ඇතිකිරීම, ඌරන් ඇතිකිරීම හා වෙනත් සතුන් ඇතිකිරීම සඳහා අවශ්‍ය ණය පහසුකම් සැලසෙනු ඇත.

**02.** **සමාජ සංවර්ධන ණය.**

- දිවිනැගුම ප්‍රතිලාභ ලබන පවුල් වල ජීවන තත්ත්වය සහ සනීපාරක්ෂක කටයුතු වැඩිදියුණු කිරීම සඳහා අවශ්‍යවන්නා වූ යටිතල පහසුකම් සැලසීම සඳහාත් පදිංචි නිවාසවලට ස්ථිර වහලක් සකස්කර ගැනීම, පදිංචිය සඳහා නිවසක් ඉදිකිරීමට ඉඩම් කැබැල්ලක් මිලදී ගැනීම, විදුලිය ලබාගැනීම, ජල පහසුකම් ලබාගැනීම වැනි අත්‍යවශ්‍ය කටයුතු සඳහා ණය පහසුකම් සලසනු ඇත. (ඉඩම් මිළදි ගැනීමේදී, නිත්‍යානුකූල නිරවුල් ඔප්පු සහිත ඉඩම් සඳහා ණය පහසුකම් සැලසිය යුතුය.)

**03.** **යොවුන් දිරිය ණය.**

දිවිනැගුම ප්‍රතිලාභී පවුල් වල තරුණ තරුණියන්ට රැකියා අවස්ථා පුළුල් කිරීමේ අදහසින් වෘත්තීය පුහුණුව ලබාගත් තරුණ තරුණියන් සඳහා ස්වයං රැකියාවක් ආරම්භ කිරීම වෙනුවෙන් අවශ්‍ය උපකරණ හා ආම්පන්න මිලදී ගැනීමටත්, ඒ සඳහා අවශ්‍ය ඉඩ පහසුකම් ලබාගැනීමටත් මෙම ණය යෝජනා ක්‍රමය ක්‍රියාත්මක වනු ඇත.

**04.** **දිවිනැගුම ඉසුර.**

දිවිනැගුම ප්‍රජා මූල බැංකු වැඩසටහනේ ණය පහසුකම් ලබාගනිමින් ව්‍යවසායකත්ව සංවර්ධන වැඩපිළිවෙල යටතේ ඉදිරියට පැමිණි ප්‍රතිලාභීන්ගේ ව්‍යාපාර කටයුතු හෝ නිෂ්පාදන සඳහා අවශ්‍ය ගොඩනැගිලි පහසුකම්, යන්ත්‍ර සූත්‍ර, වාහන පහසුකම් හා වෙනත් ප්‍රාග්ධන ස්වරූපයේ මූල්‍ය අවස්ථා, කාරක ප්‍රාග්ධනය සඳහා මෙම ණය පහසුකම් දිවිනැගුම ප්‍රජා මූල බැංකු සමිති මඟින් ක්‍රියාත්මක කරනු ඇත.

**05.** **ජීවනෝපාය චක්‍රීය අරමුදල් ණය.**

දිවිනැගුම සහනාධාර ලාභීන් අතර සිටින කාන්තා මූලික පවුල් අබාධිත හා වෙනත් හේතූන් මත ආදායම් ඉපයීමේ ශක්තිය හීන වී ඇති පවුල් වලට අරමුදල් මෙම සහනදායි ණය ක්‍රමය යටතේලබාගත හැක.

**06.** **රටවිරු නිවාස ණය.**

විදේශ රැකියා සඳහා ගොස් සිටින ශ්‍රමිකයන්ට ස්ථිර නිවසක් ඉදිකරගැනීම සඳහා මූල්‍ය දුෂ්කරතා ඇති අවස්ථාවලදී නිවසක් ඉදිකරගැනීමට අවශ්‍ය ඉඩම් කොටසක් හිමි අය සඳහා ශ්‍රී ලංකා විදේශසේවා නියුක්ති කාර්යංශය සමඟ ඒකාබද්ධව මෙම ණය වැඩසටහන ක්‍රියාත්මක කරනු ඇත.

**07.** **රටවිරු ජීවනෝපාය ණය.**

විදේශ රැකියා සඳහා ගොස් සිටින ශ්‍රමිකයන් හා දැනට විදේශගතව සිට පැමිණ සිටින ශ්‍රමිකයන්ගේ ජීවනෝපාය තත්ත්වය ඉහළ නැංවීම සඳහා විශේෂ ණය වැඩසටහනක් ලෙස ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය සමඟ බද්ධව ක්‍රියාත්මක කරනු ඇත.

**08. හදිසි ව්‍යාපාරික ණය.**

දිවිනැගුම වැඩසටහන යටතේ ප්‍රතිලාභ ලබන ස්වයං රැකියා හෝ වෙනත් ව්‍යාපාරික කටයුතු වල යෙදී සිටින කුඩා ව්‍යවසායකයන් සඳහා එදිනෙදා භාණ්ඩ මිලදී ගැනීම හා කාරක ප්‍රාග්ධන අවශ්‍යතා සඳහා කෙටිකාලීනව මෙම ණය ලබාදෙනු ඇත.

**09. ආපදා ණය.**

දිවිනැගුම ප්‍රජාමූල බැංකු වැඩසටහන සමඟ සම්බන්ධ වී කටයුතු කරන ප්‍රතිලාභීන්ගේ පවුලේ එදිනෙදා ඇතිවන්නා වූ හදිසි ආපදා තත්ත්වයන්ට මුහුණදීම සඳහා මෙම ණය යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කරනු ඇත.

**10. පාරිභෝගික ණය.**

දිවිනැගුම වැඩසටහන යටතේ බැංකු සංගම් වල සාමාජිකත්වය දරණ ප්‍රතිලාභීන්ගේ එදිනෙදා අවශ්‍යතා වෙනුවෙන් මූල්‍ය අපහසුකම් ඇතිවන අවස්ථා වලදී ඒ සඳහා අවශ්‍ය මුදල් සොයා ගැනීම පිණිස මෙම ණය යෝජනා ක්‍රමය හඳුන්වා දී ඇත.

**11. කෘෂිකාර්මික ණය.**

මෙම ණය යෝජනා ක්‍රමය කෘෂිකර්මාන්තයේ යෙදී සිටින ප්‍රතිලාභීන්ගේ වගා කටයුතු සඳහා, බිම සකස් කිරීම, අස්වනු නෙලීම, අස්වනු ගබඩා කිරීම, කෘෂිකාර්මික උපකරණ මිලදී ගැනීම,වියළීමේ පහසුකම් සඳහාත් වෙනත් කෘෂිකාර්මික කටයුතු සඳහාත් ක්‍රියාත්මක වනු ඇත.

**12. දිවිනැගුම සහන අරුණ.**

ප්‍රතිලාභීන්ගේ පාරිභෝගික අවශ්‍යතා සඳහා, ණය මුදල් පියවීම, හදිසි අවශ්‍යතා සහ ජීවනෝපාය සංවර්ධන කටයුතු වලට එම ණය මුදල් සහන පොලියක් යටතේ ලබා දෙනු ඇත.

**7. ණය පහසුකම් ලබාගැනීමට සුදුසුකම් ලබන කණ්ඩායම.**

දිවිනැගුම ප්‍රජා මූල බැංකු හා දිවිනැගුම ප්‍රජා මූල බැංකු සමිති වලින් නිකුත් කරනු ලබන ණය පහසුකම් ලබාගැනීටමම දැනට දිවිනැගුම ප්‍රජා මූල බැංකුවල සාමාජිකයන්ද ඇතුළු පහත සඳහන් අය සුදුසුකම් ලබනු ඇත.

7.1. දිවිනැගුම සහනාධාර ලබන ප්‍රතිලාභින්.
7.2. දිවිනැගුම සංවර්ධන වැඩසටහන හා සම්බන්ධ වී ඇති අඩු ආදායම් ලබන ප්‍රතිලාභින් (දිවිනැගුම සංවර්ධන නිලධාරි විසින් අඩු ආදායම්ලාභියකු ලෙස සහතික කළ අය)
7.3. දිවිනැගුම වැඩ සටහන යටතේ ප්‍රතිලාභ ලබන වෙනත් ප්‍රතිලාභින්.
7.4. දැනට දිවිනැගුම සංවර්ධන වැඩසටහන යටතේ සාර්ථක ව්‍යාපෘති/ කර්මාන්ත/ ස්වයංරැකියා/ සේවා සැපයීමේ යෙදී සිටින ප්‍රතිලාභින්.
7.5. දිවිනැගුම සංවර්ධන වැඩසටහන සම්බන්ධ ප්‍රජා මූල සංවිධාන සාමාජිකයන්.

දිවිනැගුම ප්‍රජා මූල බැංකු හා ප්‍රජා මූල බැංකු සමිති මඟින් ණය පහසුකම් අපේක්ෂා කරන්නන් තම දිවිනැගුම බල ප්‍රදේශයේ පිහිටි දිවිනැගුම ප්‍රජා මූල බැංකුවේ රු.500/- ක කොටසක් අවම වශයෙන් ලබාගෙන ප්‍රජා මූල බැංකුවේ සාමාජිකත්වය හා ණය ලබාගැනීම හා අවශ්‍ය අනෙකුත් මූලික අවශ්‍යතා මෙන්ම කුඩා කණ්ඩායම් ගත වී ප්‍රාදේශිය දිවිනැගුම ප්‍රජා මූල සංවිධානය හා එක් විය යුතුය.

**8. ණය ලබාදීමේදී ලබාගත යුතු සුදුසුකම්, සුරැකුම් හා කොන්දේසි.**

දිවිනැගුම ප්‍රජා මූල බැංකු හා දිවිනැගුම ප්‍රජා මූල බැංකු සමිති මඟින් ණය පහසුකම් ලබාගැනීමේදී අදාල ප්‍රතිලාභින් විසින් පහත දැක්වෙන සුරැකුම් හා කොන්දේසි වලින් ආවරණය වනු ඇත.

8.1. කුඩා කණ්ඩායම් ගත වී සිටින දිවිනැගුම ප්‍රතිලාභින් ප්‍රජා මූල බැංකුවෙන් ණය ලබාගැනීමේදී ලබාගන්නා ණය මුදලින් 1/10 ක් කොටස් ගිණුමේ තැන්පත් කර තිබිය යුතුය. රු. 100,000/- ක් හෝ ඊට වැඩි ණය මුදල් ලබාගැනීමේදී අවම වශයෙන් රු. 10,000/- ක කොටස් තැන්පතුවක් (කොටස් 20

ක් ) පවත්වා ගැනීම ප්‍රමාණවත් වන අතර, එහිදි තවදුරටත් කොටස් මුදල් හා කණ්ඩායම් තැන්පත් වර්ධනය කර ගැනීමට කටයුතු කළ යුතුය.(පාරිභෝගික, ස්වශක්ති ණය, සහන අරුණ ණය යෝජනා ක්‍රම වලදී මෙම කොන්දේසි ඒ ඒ උපදෙස්වලට අනුකූල විය යුතුය.)

8.2. දිවිනැගුම ප්‍රජා මූල බැංකුවක සාමාජිකත්වය ලබාගැනීමෙන් මාස 03 කට පසු ණය පහසුකම් ලබාගැනීමට හිමිකම් ලබනු ඇත.

8.3. ණය පහසුකම් ලබාගැනීමට අදාල ප්‍රතිලාභියා දිවිනැගුම ප්‍රජා මූල බැංකු බල ප්‍රදේශයේ ස්ථිර පදිංචි වයස අවුරුදු 18 ට නොඅඩු වයස අවුරුදු 60 නොඉක්ම වන අයකු විය යුතුය.

8.4. දිවිනැගුම ප්‍රජා මූල බැංකුවක සාමාජිකත්වය දරන සාමාජිකයකු වයස අවුරුදු 60 ඉක්මවා ඇති අවස්ථාවක ප්‍රතිලාභියාට ණය පහසුකම් අවශ්‍ය වන්නේ නම් පවුලේ සාමාජිකයකු සමඟ ඒකාබද්ධ ණයක් ලබාගැනීමට හැකියාව ඇත.

8.5. දිවිනැගුම ප්‍රජා මූල බැංකුවකින් ණය මුදල් අපේක්ෂා කරන ව්‍යවසායකයින් බැංකුවේ සාමාජිකයකු නොවන අවස්ථාවකදී, ව්‍යාපෘති කටයුතු කරන ව්‍යාපෘතිලාභියා හා එම පවුලේ බැංකු සංගමයේ සාමාජිකත්වය දරන ප්‍රතිලාභියා හා ඒකාබද්ධව ණයක් ලාභදායිත්වය තහවුරු කරගෙන නිකුත් කළ යුතුය.

දිවිනැගුම ප්‍රජා මූල බැංකුව/ දිවිනැගුම ප්‍රජා මූල බැංකු සමිතිය මඟින් ක්‍රියාත්මක ණය වැඩසටහන් සඳහා පහත සුරැකුම් ලබාගැනීම අනිවාර්යවේ.

| ණය සීමාව | සුරැකුම් ස්වාභාවය | වෙනත් |
|---|---|---|
| රු. 100,000 ට අඩු | කුඩා කණ්ඩායම් ඇපය | |
| රු. 100,001 - රු. 250,000 | කුඩා කණ්ඩායම් හෝ රජයේ/ පෞද්ගලික ආයතනයක සේවයේ නියුතු ස්ථිර සේවකයින් 02 කුගේ පුද්ගලික ඇපය. | |
| රු. 250,001 - රු. 500,000 | චංචල/ නිශ්චල දේපල | කාරක ප්‍රාග්ධන අවශ්‍යතා සඳහා ලබාගන්නා ණය මුදල් සඳහා පමණක් රජයේ / පෞද්ගලික ආයතනයක සේවයේ නියුතු ස්ථිර සේවකයින් 2 ගේ පුද්ගලික ඇප. |
| රු. 500,001 - රු. 1,000,000 | චංචල/ නිශ්චල දේපල | කාරක ප්‍රාග්ධන අවශ්‍යතා සඳහා ලබාගන්නා ණය මුදල් සඳහා පමණක් රජයේ / පෞද්ගලික ආයතනයක සේවයේ නියුතු ස්ථිර සේවකයින් 2 ගේ පුද්ගලික ඇප. |

8.6. දිවිනැගුම ප්‍රජා මූල බැංකුවකින් (සමෘද්ධි බැංකුවකින්) මීට පෙර ණය පහසුකම් ලබාගෙන ණය ගෙවීම් පැහැර හැර ඇති ප්‍රතිලාභීන් සඳහා එම සාමාජිකයාගේ වර්තමාන ආදායම් තත්ත්වය/ ව්‍යාපෘතිය සලකා බලා මෙම චක්‍රලේඛය මඟින් ණය පහසුකම් ලබාදීමේදී කණ්ඩායම් ඇපවලට අමතර වශයෙන් විශේෂිත වූ ඇපකරයක් ලබාගැනීමට කටයුතු කළ යුතුය.

8.7. රු. 500,001/- සිට 1,000,000/- දක්වා ණය නිකුත් කිරිමේදි ප්‍රතිලාභියාගේ ව්‍යාපෘති ඇගයීම් වාර්තාවක් ලබාගෙන එය අධ්‍යයනය කිරිමෙන් හා ව්‍යාපෘතිය පරික්ෂා කිරිමෙන් පසුව ණය පහසුකම් සලසා දිය හැක. එහිදි භෞතික වත්කමක් ඇපකර ලෙස ලබාගත යුතු අතර එම වත්කම දිවිනැගුම ප්‍රජා මූල බැංකු සමිතිය නමින් ලියාපදිංචි කළ යුතුය. ණය මුදල ගෙවා අවසන් වනතුරු ඊට අදාළ ලිපි ලේඛණ බැංකුවේ සුරක්ෂිතව තැබිය යුතුය.

8.8. දිවිනැගුම වැඩසටහන යටතේ හඳුනාගත් අර්ථලාභීන් අතර, කුඩා කණ්ඩායම්ගත වීමට අපහසුතා ඇති ප්‍රතිලාභීන් සඳහා ඔවුන්ගේ ව්‍යාපෘති හෝ ව්‍යාපාර කටයුතු වැඩි දියුණු කර ගැනීම හා ප්‍රවර්ධනය කර ගැනීමට රු. 150,000/- ක මුදලක්,පුද්ගලික ඇප දෙකක් (රාජ්‍ය නිලධාරින්ගේ හෝ ජාතික මට්ටමේ ඉහළ තත්ත්වයකට පත් වී සිටින ව්‍යාවසායකයින්) මත ලබාගැනීමේ පහසුකම් සැලසීම.

8.9. ණය පහසුකම් ලබාගන්නා ප්‍රතිලාභීන් ණය වාරික ආපසු ගෙවීමේදී ණය මුදලට අදාල මාසික වාරික මුදල හා ඊට අදාල පොලියට අතිරේකව පහත සඳහන් පරිදි ධන ආයෝජන තැන්පතු ගිණුමට තැන්පතු මුදලක් තැන්පත් කළ යුතුය.

රු. 50,000/- සිට රු. 200,000/- දක්වා රු. 150/-

රු. 250,001/- සිට රු. 500,000/- දක්වා රු. 250/-

රු. 500,001/- සිට රු. 1,000,000/- දක්වා රු. 500/-

8.10. දිවිනැගුම ප්‍රජා මූල බැංකුවකින් ණය මුදල් ලබාගන්නා ප්‍රතිලාභීන්ගේ ව්‍යාපෘතියේ ස්වභාවය හෝ ආදායම් ඉපැයීමේ ස්වභාවය අනුව මාසික ණය වාරික වෙනුවට සතිපතා වාරික ගෙවීමේ වැඩපිළිවෙලක් කෙරෙහි ප්‍රතිලාභියා යොමු කිරීමට කටයුතු කළ යුතුය. එම අවස්ථාවේදී, ණය ආපසු ගෙවීමේ කාලසීමාව ඡේද අංක 06 සඳහන් උපදෙස් ඉක්මවා නොවීමට වගබලා ගත යුතුය.

8.11. දිවිනැගුම ප්‍රජා මූල බැංකු සංගම් විසින්, ඡේද අංක 06 හි සඳහන් ජීවනෝපාය සංවර්ධන ණය, නිවාස, යොවුන් දිරිය, රටවිරු ජීවනෝපාය ණය හා කෘෂිකාර්මික ණය සඳහා පහත පරිදි මුදාහරින ණය මුදල් හා ව්‍යාපෘතීන් රක්ෂණය පහත පරිදි සිදුවිය යුතුය. ඒ සඳහා සමූහ සංරක්ෂණ හා ණය සංරක්ෂණ වැඩසටහන් යටතේ ක්ෂුද්‍ර රක්ෂණ සිදුවේ.

| **ණය සීමාව** | **සමූහ සංරක්ෂණ රු.** | **ණය සංරක්ෂණය** | |
|---|---|---|---|
| | | **ණයලාභියාගේ දායකත්වය** | **බැංකුවේ දායකත්වය** |
| 5,000/- ට අඩු | 5% | - | 1% |
| 5,001/- සිට 25,000/- | 4% | - | 1% |
| 25,001/- සිට 75,000/- | 3% | - | 1% |
| 75,001/- සිට 250,000/- | 2% | 3% | 2% |
| 250,001/- සිට 500,000/- | 1% | 3% | 2% |

කෘෂිකාර්මික කන්න බෝග හා කෙටි කාලීන බෝග සඳහා මුදාහරින ණය මුදලින් රු. 100,000/- දක්වා රු. 2% ක්ද, රු. 100,001 සිට රු. 500,000 දක්වා ඉහත සඳහන් අනුපාතයට ණය සංරක්ෂණ අරමුදලට දායක විය යුතුය.

## 9. ණය අයදුම්පත් ඉදිරිපත් කිරීම.

දිවිනැගුම ප්‍රජා මූල සංවිධාන වල හා ප්‍රජා මූල බැංකුවක සාමාජිකත්වය ලබාගත් ප්‍රතිලාභීන් කුඩා කණ්ඩායම් ගතවීමෙන් අනතුරුව, දිවිනැගුම ප්‍රජා මූල බැංකුවෙන් ණය පහසුකම් ලබාගැනීමට සුදුසුකම් ලබනු ඇත.

ඒ අනුව ග්‍රාමීය මට්ටමෙන් පැවැත්වෙන ප්‍රජා මූල සංවිධානවල රැස්වීම්වලට සහභාගිවිය යුතුය. එහිදී තමාගේ ණය මුදල් ලබාගැනීමේ අවශ්‍යතාවය දිවිනැගුම සංවර්ධන නිලධාරීන් වෙත ඉදිරිපත් කළ යුතුය. ඉන් පසු ප්‍රජා මූල බැංකුවට ගොස් ණය ලබාගැනීමට අවශ්‍ය අයදුම්පත් හා අනෙකුත් ලිපිලේඛණ කළමනාකරුගේ අනුමැතිය සහිතව ණය අයදුම්පත් නිකුත් කරන ණය විෂයභාර නිලධාරීන්ගෙන් ලබාගත යුතුය.

එම අයදුම්පත් නිසි පරිදි සම්පූර්ණ කර, ව්‍යාපෘති වාර්තාවක් සමඟ ප්‍රජා මූල සංවිධානයේ ලේකම්/ සභාපතිගේ නිර්දේශය හා වසම් භාර දිවිනැගුම සංවර්ධන නිලධාරියාගේ නිර්දේශය ද, සහිතව බැංකුවේ ණය විෂයභාර නිලධාරී වෙත ඉදිරිපත් කළ යුතුය.

## 10. ණය අයදුම්පත් අනුමත කිරීම.

දිවිනැගුම ප්‍රජා මූල බැංකුව වෙත ලැබී ලේඛණගත කළ ණය අයදුම්පත් පාලක මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීමට ප්‍රථම ණය මුදල නිර්දේශ කිරීමට පෙරාතුව අවශ්‍ය වන්නේ නම් අදාල ව්‍යාපෘතිය දිවිනැගුම සංවර්ධන නිලධාරී/ දිවිනැගුම ව්‍යාපෘති කළමනාකරු ක්ෂේත්‍ර පරීක්ෂණයක් කර, ශක්‍යතා වාර්තාව ද සමඟ නිර්දේශ කළ යුතුය. එසේ නිර්දේශ කළ ද, දිවිනැගුම බැංකු කළමනාකරු සෑහීමකට පත් නොවන්නේ නම් පෞද්ගලිකව ව්‍යාපෘතිය/ අවශ්‍යතාව පරීක්ෂා කිරීමේ අභිමතය ඇත.

"සහන අරුණ" ණය සම්බන්ධව අනුමත කිරීම් අදාල චක්‍ර ලේඛණයේ උපදෙස් පරිදි වන අතර එහි ව්‍යාපෘති වාර්තාව අදාල ප්‍රජා මූල බැංකු සමිති කළමනාකරු හෝ ඔහුගේ බලය පැවරූ නිලධාරියකු විසින් කළ යුතුවේ.

කළමනාකරු විසින් මසකට දෙවරක් හෝ අයදුම්පත් ලැබී ඇති ආකාරය සලකා බලා පාලක මණ්ඩල රැස්වීම කැඳවා අනුමැතය සඳහා හෝ ආවරණ අනුමැතිය සඳහා (දි. බැ පෝරම අංක 2 පිටපත් දෙකකින් සකස් කර) ණය ඉල්ලුම්පත් පාලක මණ්ඩලයට ඉදිරිපත් කළ යුතුය. එහිදි පාලක මණ්ඩලය විසින් සියළුම අවශ්‍යතා සපුරා ඇති ණය අයදුම්පත් අනුමත කර (දි.බැ ණය පෝරම අංක 2) සභාපතිගේ අත්සන සහිතව කළමනාකරු වෙත භාරදීමෙන් පසුව ප්‍රතිලාභීන් වෙත දිවිනැගුම බැංකු කළමනාකරු විසින් ණය මුදල් නිකුත් කරනු ඇත.

**11 ණය ආපසු අයකර ගැනීම හා පසුවිපරම් කිරීම.**

චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව ප්‍රතිලාභීන් වෙත නිකුත් කරනු ලබන ණය මුදල් සඳහා ගිවිසුම් ගත වී ඇති පරිදි ණය වාරිකය හා පොලිය ගණනය කර නියමිත දිනයේදී ප්‍රජා මූල බැංකුව වෙත ආපසු ගෙවීමට ප්‍රතිලාභියා බැඳී සිටිනු ඇත. එහිදි ණය ආපසු අයකර ගැනීමට පහත සඳහන් නිලධාරීන් හා සංවිධාන වගකීම් දරනු ඇත.

- **දිවිනැගුම ප්‍රජා මූල බැංකු සමිති කළමනාකරු**

දිවිනැගුම ප්‍රජාමූල බැංකුවක් මඟින් නිකුත් කරනු ලබන ණය මුදල් පිළිඳව අවස්ථානුකූලව සෝදිසි පරීක්ෂණයක් බැංකු සමිතිය වෙත පැමිණ අදාළ ලිපිලේඛන හා ණය ලිපිගොනු පරීක්ෂා කර බලා සිදුකළ යුතුය. අවශ්‍ය විටක ක්ෂේත්‍ර පරීක්ෂණයක් මඟින් ද පරීක්ෂාව සිදු කිරීමට ද වගබලා ගත යුතුය. එහිදී වසම්භාර දිවිනැගුම සංවර්ධන නිලධාරිගේ ණය නිකුත් කිරීම් හා ආපසු අයකර ගැනීම් ප්‍රගතිය හා වසමේ රාජකාරි සිදුකර ඇති ආකාරයත් බැංකුවේ ණය විෂයය භාර සංවර්ධන නිලධාරිගේ ණය ක්‍රියාවලිය පිළිබඳ කටයුතු කර ඇති ආකාරයත්, පරීක්ෂාවට ලක් කළ සිදුකළ යුතුය. එමෙන්ම සතියේ බ්‍රහස්පතින්දා දින පැවැත්වෙන දිවිනැගුම සංවර්ධන නිලධාරි ප්‍රගති සමාලෝචන රැස්වීමේදී ගෙන ඇති තීන්දු තීරණ හා ප්‍රගති වාර්තා පරීක්ෂා කළ යුතුය. එහිදී තම ඉලක්ක වෙත ළඟා නොවූ නිලධාරීන් හා ඉලක්ක ළඟා කරගැනීමට ඇති හැකියාව හා ඊට අවශ්‍ය මඟ පෙන්වීම් ලබාදිය යුතුය. තවද සෑම මසකම එක් දිනයක් තෝරාගනිමින් බැංකු කාර්යය මණ්ඩලය හා ක්ෂේත්‍ර කාර්යය මණ්ඩලය ණය, තැන්පතු හා අනෙකුත් විෂයය කරුණු පිළිබඳ ප්‍රගතිය සමාලෝචනයක් සිදුකර එම වාර්තා අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මූල්‍ය) වෙත ලබාදිය යුතුය.

- **දිවිනැගුමප්‍රජාමූලබැංකු කළමණාකරු.**

දිවිනැගුම ප්‍රජා මූල බැංකුවක් නිකුත් කරනු ලබන ණය මුදල ආපසු අයකර ගැනීම සඳහා ප්‍රතිලාභියා වෙත ණය නිකුත් කරන අවස්ථාවේදීම ණය වාරිකය, පොලිය ගණනය කරන ආකාරය හා වාරිකය ගෙවීම් කළ යුතු දිනය ලිඛිතව දැනුවත් කිරීමක් කළ යුතුය. ඒ අනුව, මාසික/ කන්න/ සති වශයෙන් ණය වාරිකය නියමිත දිනවලදී බැංකුව වෙත ලැබෙන බවට පසු විපරම් කිරීම හා ණය පිළිබඳ ප්‍රගති වාර්තා ලබාගනිමින් සතියේ සෑම බ්‍රහස්පතින්දා දිනකම ප්‍රගති සමාලෝචනයක් සිදු කළ යුතුය. ණය පැහැර හැරීම් ඇතොත් වසම් භාර නිලධාරි සමඟ කේෂ්ත්‍රයේ පරික්ෂණයක් සිදු කර නිසි පරිදි අයකර ගැනීමට සුදුසු වැඩ පිළිවෙලක් සකස් කර ගත යුතුය. කේෂ්ත්‍රයේද නිලධාරීන් විසින් අයකර ගනු ලබන ණය වාරික හා පොලි මුදල් නියමිත පරිදි නිලධාරීන් ගිවිසගත් දිනවල බැංකුව වෙත ලැබී නියමිත පරිදි ලේඛණ ගතවන බවට සෑහීමකට පත්විය යුතුය.

- **ණයවිෂයභාරදිවිනැගුමසංවර්ධන නිළධාරි.**

දිවිනැගුම ප්‍රජා මූල බැංකුවකින් නිකුත් කරනු ලබන ණය පිළිබඳව ණය මුදාහැරීමේ තොරතුරු ලේඛණය නිසි පරිදි නඩත්තු කළ යුතු අතර එම ලේඛණය අනුව ප්‍රතිලාභියාගේ ණය වාරිකය හා පොලිය ද ආපසු ගෙවිය යුතු දිනය ද කලට වේලාවට කළමනාකරු හා වසම්භාර නිලධාරීන් කල්වේලා ඇතිව දැනුවත් කළ යුතුය. ණය වාරික ගෙවීම ප්‍රමාද වන්නේ නම් ඒ සඳහා සිහිකැඳවීම් ලිපි මඟින් ප්‍රතිලාභීන් දැනුවත් කළ යුතුය. ලැබෙන ණය වාරික නිසි පරිදි ලේඛණ ගත වන බවට සෑහීමකට පත්විය යුතුය.

- **වසම්භාර දිවිනැගුම සංවර්ධන නිලධාරින්.**

  ප්‍රතිලාභින්ගේ ණය වාරික ආපසු අයවිය යුතු දිනයන් හා වාරිකය පිළිබඳ වෙනම ලේඛනයක් තබාගත යුතුය. ඒ අනුව නියමිත දිනයේදී හෝ ඊට පෙර ණය වරිකය අයකර ගැනීමට කටයුතු කළ යුතු නිලධාරියා වසමේ රාජකාරි නිරතවන සෑම අවස්ථාවකම ණය ආපසු අයකර ගැනීමට හා ව්‍යාපෘති පසු විපරම් කටයුතු සිදු කළ යුතුය. ලේඛනය අනුව අයකරගත් ණය වාරිකය අයකරගැනීම හා පැහැර හැරි පුද්ගලයන්ට බැංකුවෙන් නිකුත් කරනු ලබන ලිපි භාරදීමේ වගකීම ද පැවරෙනු ඇත.

- **දිවිනැගුමප්‍රජාමූලසංවිධානනායකයන්ගේවගකීම.**

  දිවිනැගුම ප්‍රජා මූල බැංකුවකින් දිවිනැගුම ප්‍රජා මූල බැංකු සමිතියකින් ණය පහසුකම් අපේක්ෂා කරන ප්‍රතිලාභින්පිළිබඳව ප්‍රජා මූල සංවිධාන රැස්වීම්වලදී සාකච්ඡාවට භාජනය කර ඔවුන්ගේ ව්‍යාපෘති හෝ ක්‍රියාකාරකම් පිළිබඳ මනා අවබෝධයක් ලබාගනිමින් එම ප්‍රතිලාභින්ට නියමිත කාල වකවානුවලදී ණය මුදල ලබාගැනීමට හැකි වන පරිදි සුදුසු වැඩ පිළිවෙලක් සකස් කර ගත යුතුය. ණය මුදලක් ප්‍රදානය කිරීමෙන් අනතුරුව එම ව්‍යාපෘතිය ක්‍රියාත්මක තත්ත්වය පිළිබඳ පසු විපරම් කිරීම හා ණය වාරික නියමිත දිනවලදී ආපසු අයකර ගැනීමට වසම්භාර දිවිනැගුම සංවර්ධන නිලධාරින් සමඟ එක්ව සතිපතා ණය ප්‍රගතිය සමාලෝචනයක් සිදු කිරීමට ප්‍රජා මූල සංවිධාන නායකයන් කටයුතු කළ යුතුය. කිසියම් ප්‍රතිලාභියකු ණය ගෙවීම පැහැර හැරිමක් සිදුවන බව පෙනී ගියහොත් එම ප්‍රතිලාභින් කැඳවා පැහැදිලි කිරිම් සිදු කර ණය වාරික නියමිත පරිදි අයකර ගත යුතුය. ඊට අමතරව දිවිනැගුම පනතේ දැක්වෙන පරිදි ණය කටයුතු අධීක්ෂණය හා නියාමනය සිදුකළ යුතුය.

- **ප්‍රජාමූලබැංකුපාලකමණ්ඩලයේවගකීම.**

  දිවිනැගුම ප්‍රජා මූල බැංකු බල ප්‍රදේශය තුල පදිංචි ප්‍රතිලාභින්ගේ ණය අවශ්‍යතා පිළිබඳ ප්‍රජා මූල සංවිධාන මට්ටමේ සිට ප්‍රජා මූල බැංකුව දක්වා සිදුවන ක්‍රියාදාමයට බැංකුවේ පාලක මණ්ඩලයේ නිලධාරින් හා සාමාජිකයන් සෘජුවම මැදිහත් විය යුතුය. එමෙන්ම අවශ්‍යතාවලට ගැලපෙන අයුරින් ණය අනුමත කර ගැනීම සඳහා පාලක මණ්ඩල රැස්වීම් පැවැත්වීම හා අවශ්‍යතාවලට ගැලපෙන අයුරින් ණය අනුමත කිරිමේ කාර්ය ඉටු කළ යුතුය. ණය ආපසු අයකර ගැනීමේදී පැලක මණ්ඩලය රැස්වන සෑම අවස්ථාවකම ණය ප්‍රගතිය පිළිබඳ සමාලෝචනයක් සිදු කර නිසි පරිදි කලට වේලාවට ණය ආපසු අයකර ගැනීමට කටයුතු කළ යුතුය.

**12 ණය අනුමත කිරීමේ සීමාවන්.**

දිවිනැගුම ප්‍රජා මූල බැංකුවක් හා දිවිනැගුම ප්‍රජා මූල බැංකු සමිතියක් ප්‍රතිලාභින් වෙත ණය පහසුකම් ලබාදීමේදී පහත සඳහන් මූල්‍ය බලතල හා සීමාවන් තුල අනුමැතිය ලබාදීම හා ණය නිකුත් කිරීම සිදු කළ යුතුය.

12.1. දිවිනැගුම ප්‍රජා මූල බැංකුවක් ලබාදිය හැකි මුළු ණය ප්‍රමාණය ප්‍රජා මූල බැංකුවේ මුළු තැන්පතු හා සංචිතවල එකතුවෙන් 80% ක් නොඉක්ම විය යුතුය. මෙම සීමාව බාහිර ආයතන වලින් අරමුදල් සපයාගෙන ණය ලබාදීම සම්බන්ධයෙන් බල පවත්වනු නොලැබේ.

12.2. දිවිනැගුම ප්‍රජා මූල බැංකුවක සාමාජිකත්වය දරණ ප්‍රතිලාභින් බැංකු ණය සංස්කෘතිය තුල ලබාගන්නා ණය පහසුකම් ප්‍රජා මූල බැංකුවක පාලක මණ්ඩලය විසින් රු. 300,000/- දක්වා ණය අනුමත කිරීමටත් ඉන් අනතුරුව, දිවිනැගුම බැංකු කළමනාකරුට අනුමත ණය මුදල් නිදහස් කිරීමටත් කටයුතු කළ හැකි අතර රු. 300,001/- සිට රු. 500,000/- දක්වා ණය අයදුම්පත් ප්‍රජා මූල බැංකු සමිතීන් විධායක කමිටුවේඅනුමැතියට පෙර දිවිනැගුම ප්‍රජා මූල බැංකුවේ පාලක මණ්ඩලයේ අනුමැතිය සඳහා ඉදිරිපත් කළ යුතු අතර, එම අනුමැතිය ලැබීමෙන් පසු ණය මුදාහැරීමට බලය හිමිවනු ඇත. (පාරිභෝගික, සහන අරුණ හා ස්වශක්ති ණය සඳහා ආවරණ අනුමැතිය ලබාගත යුතුය.)

12.3. දිවිනැගුම ප්‍රජා මූල බැංකු වලින් රු. 500,000/- දක්වා ණය පහසුකම් ලබාගත් ප්‍රතිලාභින්ට රු. 500,001/- සිට රු. 1,000,000/- දක්වා ණය පහසුකම් ඉල්ලා සිටින අවස්ථාවල එම ප්‍රතිලාභින්ගේ පෙර ණය ලබාගැනීම් හා ආපසු ගෙවීම් පිළිබඳ පූර්ව විමසුමක්සිදු කර අදාල ණය අයදුම්පත් නිකුත් කිරීමෙන් අනතුරුව අවශ්‍ය ලිපි ලේඛණ සමඟ ප්‍රජා මූල බැංකු සමිතියේ කළමනාකරුගේ නිර්දේශය

ලබාගෙන, විධායක කමිටුවේ අනුමැතියට ලබාගැනීමටපෙරාතුව අදාල අයඳුම්පත් දිවිනැගුම නිලධාරි (ක්ෂුද්‍රමූල්‍ය)ගේ අනුමැතියට ඉදිරිපත් කර පූර්ව අනුමැතිය ලබාගැනීමෙන්, පසු ප්‍රජා මූල බැංකු සමිති විධායක කමිටු අනුමැතිය ලබාගෙන කළමනාකරුට ණය මුදල් නිදහස් කළ හැකිය.

12.4. දිවිනැගුම ප්‍රජා මූල බැංකුවක සාමාජිකත්වය දරණ ප්‍රතිලාභියෙක් ණය මුදලක් ඉල්ලුම් කර අනුමත වී ඇතත් කළමනාකරු කිසියම් ආකාරයකින් නිවාඩු ලබා ඇත්නම්, එම ණය නිදහස් කිරීමේ බලය බැංකු සංගමයේ සහකාර කළමනාකරු වෙත පැවරීමට කළමණාකරු කටයුතු කළ යුතුය.

## 13 වෙනත් ණය පහසුකම්.

දිවිනැගුම ප්‍රජා මූල බැංකුව විසින්, දිවිනැගුම ප්‍රතිලාභින් වෙත නිකුත් කරනු ලබන ආදායම් උත්පාදනය හා ස්වයංරැකියා ණයවලට අතිරේකව ප්‍රතිලාභින්ගේ සුභ සාධක අවශ්‍යතා හා අතිරේක මූල්‍ය අවශ්‍යතා සඳහා ද ණය පහසුකම් සලසනු ඇත.

13.1. දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව හා ලංකා විදුලි බල මණ්ඩලය සමඟ එක්ව දිවිනැගුම බැංකුවල ප්‍රතිලාභ ලබන්නන්ගේ නිවෙස්වලට විදුලි ලබාගැනීමට මූල්‍ය දුෂ්කරතා ඇති අවස්ථාවල නිවසට විදුලි සම්බන්ධතාව ලබාගැනීමට අවශ්‍ය මූලික තැන්පත් කිරීම් සඳහා රු. 40,000/- ක මුදලක් 9% ක පොලී ප්‍රතිශතයක් යටතේ මාස 60 කින් ආපසු ගෙවීමට "විදුලි ඇත්වැල" ණය යෝජනා ක්‍රම යටතේ ණය පහසුකම් ලබාදෙනු ඇත.

13.2. ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය හා විදේශ රැකියා ප්‍රවර්ධන හා සුභ සාධන අමාත්‍යාංශය ඒකාබද්ධ වී විදේශගත වන ශ්‍රමිකයන් සඳහා නව නිවසක් ඉදිකර ගැනීමට අවශ්‍ය ණය පහසුකම් "රටවිරු නිවාස ණය වැඩසටහන" යටතේ රු. 300,000/- ක් 9% ක පොලි ප්‍රතිශතයන් සමඟ මාස 60 කින් ආපසු ගෙවීමට ලබාදෙන අතර ඔවුන්ගේ පවුල්වල සාමාජිකයන්ගේ ජීවනෝපාය සංවර්ධන කටයුතු සඳහා ස්වයංරැකියාවන් හෝ ආදායම් උත්පාදන ව්‍යාපෘතියක් ආරම්භ කිරීම සඳහා රු. 500,000/- ක උපරිමයකට යටත්ව 8% ක පොලි ප්‍රතිශතයක් යටතේ මාස 60 කින් ආපසු ගෙවීම සඳහා ණය පහසුකම් සලසාදෙනු ඇත.

13.3. දිවිනැගුම ප්‍රජා මූල බැංකුවල ප්‍රතිලාභ ලබන්නන්ගේ නිවාසවලට ජල සම්පාදන හා ජල ප්‍රවාහන මණ්ඩලයෙන් ජල සම්බන්ධතා ලබාගැනීමේදී ඇති වන මූල්‍ය දුෂ්කරතා සඳහා දිවිනැගුම ප්‍රජා මූල බැංකු මඟින් රු. 25,000/- ක උපරිමයකට යටත්ව 8% ක පොලි ප්‍රතිශතයක් සමඟ මාස 48 කින් ආපසු අයකර ගැනීම සඳහා ණය පහසුකම් ලබාදෙනු ඇත.

13.4. දිවිනැගුම ප්‍රජා මූල බැංකුවල සාමාජිකත්වය ලබා ඇති ප්‍රතිලාභින්ගේ පදිංචි නිවාසවලට ස්ථිර වහලක් සකස් කර ගැනීම, ගෙබිම සිමෙන්ති දැමීම, බිත්ති බැඳීම, බිත්ති කපරාරු කිරීම වැනි කටයුතු සඳහාත් සනීපාරක්ෂක පහසුකම් සලසා ගැනීම සඳහා දිවිනැගුම ප්‍රජා මූල බැංකු මඟින් රු. 300,000/- ක උපරිමයකට යටත්ව 8% පොලී ප්‍රතිශතයක් යටතේ මාස 60 කින් ආපසු අයකිරීමට ණය පහසුකම් ලබාගත හැක.

13.5. දිවිනැගුම ප්‍රජා මූල බැංකුවල සාමාජිකත්වය ලබා ඇති ප්‍රතිලාභින් අතුරින් ඔවුන් පදිංචි නිවාසයට ස්ථිර වහලක් සකස් කර ගැනීම සඳහා අවශ්‍ය උළු හෝ සෙවිලි තහඩු ලැබී ඇතත් වහලය සකස් කර ගැනීමට මූල්‍ය දුෂ්කරතා ඇති ප්‍රතිලාභින්ට පොලි රහිතව මාසික වාරික 48 කින් ආපසු අය කරනු ලබන රු. 50,000/- ක උපරිමයකට යටත්ව ප්‍රජා මූල බැංකුවේ පොදු සුභ සාධක අරමුදලින් ප්‍රජා මූල බැංකු බල ප්‍රදේශයේ තෝරාගත් ප්‍රතිලාභින් සඳහා කළමණාකරුගේ අභිමතය පරිදි ණය පහසුකම් සැලසීමට හැකියාව ලබාදී ඇත.

13.6. දිවිනැගුම ප්‍රජා මූල බැංකු වලින් ණය පහසුකම් ලබාගෙන සාර්ථක ව්‍යවසායකයකු ලෙස කටයුතු කරමින් ලබාගෙන ඇති ණය මුදල් නිසි පරිදි ගෙවා අවසන් කර ඇති ප්‍රතිලාභීන් සඳහා දිරිගැන්වීමක් ලෙස ඔවුන්ගේ ව්‍යාපාර කටයුතු තවදුරටත් වැඩි දියුණු කර ගැනීම සඳහා ප්‍රජා මූල බැංකුවල "ජීවනෝපාය චක්‍රිය අරමුදලක් " 5% ක පොලි ප්‍රතිශතයක් යටතේ මාස 48 කින් ආපසු ගෙවා අවසන් කළ යුතු රු. 75,000/- ක උපරිමයකට යටත්ව ණය ලබාදීමට හැකියාව ඇත.

13.7. දිවිනැගුම ප්‍රජා මූල බැංකු සංගම්හි ඉතිරි කිරීම් තැන්පතු මත ලබාදෙන ස්වශක්ති ණය යෝජනා ක්‍රමය තවදුරටත් කිසිදු වෙනසක් නොවන පරිදි ක්‍රියාත්මක වේ.

13.8. මහාභාණ්ඩාගාරයේ උපදෙස් හා මඟ පෙන්වීම යටතේ රාජ්‍ය නිලධාරින් සඳහා සහනදායි මිලට යතුරු පැදි ලබාදීමේ ජාතික වැඩසටහන මඟින් දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුවේ නිලධාරින් වෙනුවෙන් ක්‍රියාත්මක කිරීමේ දී එම යතුරුපැදි සඳහා ගෙවිය යුතු මූලික මුදල වන රු.50,000/- සඳහා 6.5% ක පොලී අනුපාතයක් යටතේ මාස 48 කින් ආපසු අයකර ගැනීමට ණය පහසුකම් සලසනු ඇත.

13.9. දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව පිහිටුවීමට පෙර සමෘද්ධි අධිකාරියේ බැංකු මූල්‍ය කටයුතු හා මහ සංගම් අංශයෙන් ලබාදුන් පහත ණය පහසුකම් ඉදිරියේ දී දිවිනැගුම ප්‍රජා මූල බැංකු සමිති වලින් ලබාදීමට කටයුතු කරනු ඇත.

| ණය වර්ගය | මුදල රු. | පොලී අනුපාතය | මාසික වාරිකය |
|---|---|---|---|
| පාරිභෝගික ණය | 100,000/- | 10% | 60 |
| යතුරුපැදි ණය | 150,000/- | 10% | 60 |
| වාස ඉදිකිරීම හා ඉඩම් මිලදී ගැනීම | 500,000/- | 10% | 180 |

**14 ප්‍රගති සමාලෝචන රැස්වීම් පැවැත්වීම.**

දිවිනැගුම ප්‍රජා මුල බැංකු හා දිවිනැගුම ප්‍රජා මූල බැංකු සමිති මඟින් නිකුත් කරනු ලබන ණය මුදාහැරීම, ආපසු අයකිරීම පිළිබඳ පහත සඳහන් පරිදි ප්‍රගති සමාලෝචනයක් සිදු කළ යුතු අතර, ව්‍යාපෘති ඇගයීම හා පසු විපරම් කිරීමක් විශේෂිත අවස්ථාවක් හැරුණු කොට සිදු කළ යුතුය.

| අනු අංක | මට්ටම | කාල සීමාව | සහභාගි වන නිලධාරින් | වගකීම් දරණ නිලධාරින් |
|---|---|---|---|---|
| | ප්‍රජා මූල සංවිධානය | සති 2 කට වරක් | ග්‍රාමීය සාමාජිකයින් | දිවිනැගුම සංවර්ධන නිලධාරි/ සභාපති |
| | දිවිනැගුම ප්‍රජා මූල බැංකු මට්ටම | සති 1 කට වරක් | ක්ෂේත්‍ර දිවිනැගුම සංවර්ධන නිලධාරින් | දිවිනැගුම කළමනාකරු/ ක්ෂේත්‍ර සහකාර/ ණය ලිපිකරු |
| | දිවිනැගුම ප්‍රජා මූල බැංකු සමිතිය | සති 2 කට වරක් | ප්‍රජා මූල බැංකු කළමනාකරුවන්/ ක්ෂේත්‍ර සහකාරකරුවන්/ ණය විෂය ලිපිකරුවන් | දිවිනැගුම ප්‍රජා මූල බැංකු සමිති කළමනාකරු/ ව්‍යාපෘති කළමනාකරු |
| | දිස්ත්‍රික් / කලාප මට්ටම | මාස 1 කට වරක් | දිවිනැගුම ප්‍රජා මූල බැංකු/ සමිති කළමනාකරුවන්/ ව්‍යාපෘති කළමනාකරුවන් | දිස්ත්‍රික් අතිරේක අධ්‍යක්ෂ ජනරාල් දිස්ත්‍රික් දිවිනැගුම නිලධාරි නියෝජ්‍ය අධ්‍යක්ෂ |
| | කලාප මට්ටම | මාස 3 කට වරක් | දිවිනැගුම ප්‍රජා මූල බැංකු/ සමිති කළමනාකරුවන්/ දිස්ත්‍රික් දිවිනැගුම නියෝජ්‍ය අධ්‍යක්ෂවරුන් | කලාප අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරුන් |
| | ජාතික මට්ටම | මාස 3 කට වරක් | දිවිනැගුම ප්‍රජා මූල බැංකු/ සමිති කළමනාකරුවන්/ දිස්ත්‍රික් දිවිනැගුම නිලධාරීන් හා නියෝජ්‍ය අධ්‍යක්ෂවරුන් | අධ්‍යක්ෂ ජනරාල් අධ්‍යක්ෂ (ක්ෂුද්‍රමූල්‍ය) |

- දිවිනැගුම ප්‍රජා මූල බැංකු සමිති බල ප්‍රදේශයක පිහිටි දිවිනැගුම ප්‍රජා මූල බැංකු කාර්යය මණ්ඩලය හා ක්ෂේත්‍ර කාර්යය මණ්ඩලය සඳහා මසකට වරක් බැංකු වල දෛනික රාජකාරි අවසන්වීමෙන් පසු එම බැංකු වල ණය ක්‍රියාවලිය හා අනෙකුත් කටයුතු පිළිබඳ ප්‍රගති සමාලෝචනයක් සිදුකර එම වාර්තා වල පිටපත් දිවිනැගුම ප්‍රජා මූල බැංකු අංශය වෙත ඉදිරිපත් කළ යුතුය. මීට අමතරව මෙම අවශ්‍යතාවය හා විශේෂිත හේතු මත අවශ්‍ය පරිදි ප්‍රගති සමාලෝචන රැස්වීම් අධ්‍යක්ෂ ජනරාල් / අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මූල්‍ය) අනුමැතිය මත සිදු කල හැකිය.

**15 ණය පිළිබඳ නියාමනය හා අධික්ෂණය.**

දිවිනැගුම ප්‍රජා මුල බැංකු හා දිවිනැගුම ප්‍රජා මුල බැංකු සමිති මඟින් දිවිනැගුම ප්‍රතිලාභින් වෙත නිකුත් කරනු ලබන ණය මුදල්, පිළිබඳව සමස්ථ ක්‍රියාවලිය නියාමනය හා අධික්ෂණය දිවිනැගුම ප්‍රජා මුල බැංකු අංශය යටතේ දැනට ක්‍රියාත්මක වන බැංකු අධික්ෂණ ඒකකවල නිලධාරින් විසින් සිදු කර එම වාර්තා හා ප්‍රගතිය පිළිබඳ වාර්තා අධ්‍යක්ෂ (ක්ෂුද්‍රමූල්‍ය) වෙත ඉදිරිපත් කළ යුතුය.

**16 විගණන කටයුතු සිදු කිරීම.**

දිවිනැගුම ප්‍රජා මුල බැංකු හා දිවිනැගුම ප්‍රජා මුල බැංකු සමිති මඟින් දිවිනැගුම ප්‍රතිලාභින් වෙත නිකුත් කරනු ලබන ණය පිළිබඳ සමස්ථ ක්‍රියාවලිය දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර විගණන අංශයේ නිලධාරින් විසින් අඛණ්ඩව සිදු කර එම වාර්තා අධ්‍යක්ෂ ජනරාල් වෙත ඉදිරිපත් කළ යුතුය.

**17. ණය ප්‍රගතිය ලබාගැනීම.**

සෑම දිවිනැගුම ප්‍රජාමුල බැංකුවක් විසින්ම මාසිකව මුදාහරින ණය පිළිබඳව හා ලැබෙන ණය අයදුම්පත් පිළිබඳව ප්‍රගතිවාර්තා ඇමුණුම 01 අනුව ඊළඟ මාසයේ 03 දිනට පෙර තම බල ප්‍රදේශයේ දිවිනැගුම ප්‍රජා මුල බැංකු සමිතිය වෙත ඉදිරිපත් කළ යුතු අතර, එම වාර්තා ඇසුරෙන් දිවිනැගුම ප්‍රජා මූල බැංකු සමිතියක් ඊළඟ මස 05 දිනට පෙර ඇමුණුම අංක 02 මඟින් සකස් කළ ණය පිළිබඳ වාර්තාවක් දිස්ත්‍රික්දිවිනැගුම ක්ෂුද්‍රමූල්‍ය නිලධාරි මගින් දිස්ත්‍රික් හා කලාප දිවිනැගුම අතිරේක අධ්‍යක්ෂ ජනරාල් වෙත ඉදිරිපත් කළ යුතුය. දිස්ත්‍රික් ක්ෂුද්‍ර මූල්‍ය නිලධාරි විසින් ඇමුණුම් අංක 03 යටතේ සකස් කරන ලද ප්‍රගති වාර්තාව ඊළඟ මස 07 දිනට පෙර දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්/ අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මූල්‍ය) වෙත ලැබෙන පරිදි ඉදිරිපත් කළ යුතුය.

එම තොරතුරු දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුවේ කළමණාකරණ තොරතුරු ඒකකය මඟින් ජාතික මට්ටමේ වාර්තාව සකස් කර කළමණාකරන මණ්ඩලය වෙත ඉදිරිපත් කළ යුතුය.

**18. පොදු උපදෙස්.**

18.1. අනුමතකළ ණය මුදාහැරීමේ දී ව්‍යාපෘතීන්ට අනුව එක් එක් අදියරේ දී අවශ්‍ය වන මුදල් පමණක් නිදහස් කළ යුතු අතර, එම වාරික මුදල් නිසි පරිදි ව්‍යාපෘති සඳහා යොදාගත් බවට දිවිනැගුම සංවර්ධන නිලධාරින්ගෙන් වාර්තාවක් ලබාගත් පසු අනිකුත් වාරික නිදහස් කළ යුතුය.

18.2. වාහන හා යන්ත්‍ර සූත්‍ර උපකරණ මිලදී ගැනීමේ දි නිකුත් කරනු ලබන ණය මුදල අදාළ ආයතනයන්ගේ නමට චෙක්පතකින් නිකුත් කළ යුතුය.

18.3. නිසි පරිදි පූර්ව විමර්ශනයක් හා පසුවිපරමක් යටතේ සිදුනොකරන ණය මුදාහැරීම් ආපසු අයකර ගැනීමේ දී දුෂ්කරතා වලට මුහුණදෙන බැවින් ණය මුදාහැරීම පිළිබඳව වසම් භාර දිවිනැගුම සංවර්ධන නිලධාරින් හා බැංකු කළමණාකරුවන් එක්ව සාමූහික වගකීමෙන් කටයුතු කළ යුතුය.

18.4. බැංකුව විසින් මුදාහරිනු ලබන ණය මුදල් වෙනුවෙන් වෙන වෙනම ණය ලිපිගොනු විවෘතකර අදාළ වන්නා වූ ලිපි ලේඛන එහි ගොනු කර තැබිය යුතුය.

18.5. සෑම මසක් අවසානයේ දීම ණය පිළිබඳ ප්‍රගතිය වාර්තා කිරීම හා ණය පිළිබඳ පසුවිපරම් කිරීමේ ක්‍රියාවලිය දිවිනැගුම බැංකු කලමණාකරු විසින් සිදුකළ යුතුය.

18.6. නිලධාරින්ගේ කාර්යය සාධනය තීරණය කිරීමේ දී නිලධාරින් බැංකුව තුළ හා වසම් වලදී ණය කලඹ කළමණාකරණය පිළිබඳව ලබාඇති ප්‍රගතිය සැලකිල්ලට ගන්නා බැවින් ඒ පිළිබඳ නිලධාරීන් දැනුවත් කළ යුතුය.

18.7. මෙම චක්‍ර ලේඛනයේ උපදෙස් ක්‍රියාත්මක වීමත් සමඟ මේ දක්වා සිදුකරනු ලබන සහන පොළී ප්‍රතිපූර්ණය කිරීම සිදුනොකරන බව වැඩිදුරටත් දන්වා සිටිමි.

18.8. දිවිනැගුම ජාතික සංවර්ධන වැඩසටහන යටතේ ක්‍රියාත්මක වන සංවර්ධන ව්‍යාපෘති වල තෝරාගත් ප්‍රතිලාභීන් සඳහා ලබාදෙන ප්‍රතිපාදන වලට අතිරේක වශයෙන් අවශ්‍ය වන්නා වූ මූල්‍ය පහසුකම් දිවිනැගුම ප්‍රජා මූල බැංකු මඟින් ලබාදීමට කටයුතු කළ යුතුය.

18.9. දිවිනැගුම ප්‍රජා මූල බැංකු වල හා දිවිනැගුම බැංකු සමිති වල කළමනාකරුවන් හා දිවිනැගුම සංවර්ධන නිලධාරින් තමාගේ බැංකු බල ප්‍රදේශයේ ජනතාවගේ ජීවන තත්ත්වය නඟාසිටුවීම

වෙනුවෙන් රාජකාරි වගකීමක් නිශ්චිතව පැවරෙන අතර, ඒ අනුව නිලධාරියා තම කාර්ය සාධනයේ දී එම වගකීම් වඩා ඵලදායි ලෙස ඉටුකිරීමට වග බලා ගත යුතු බව අවධාරණය කරමි.

18.10. දිවිනැගුම ප්‍රජා මූල බැංකුවක් හෝ දිවිනැගුම බැංකු සමිතියක් නිකුත් කරනු ලබන රු. 250,000/- සිට රු.1,000,000/- දක්වා ණය මුදල් යටතේ මිලදී ගනු ලබන යතුරුපැදි, ට්‍රැක්ටර්, ත්‍රීවීලර් රථ, මෝටර් වැන් රථ, වල ලියාපදිංචි සහතිකයෙහි පරම අයිතිය දිවිනැගුම ප්‍රජා මූල බැංකුවට හෝ දිවිනැගුම ප්‍රජා මූල බැංකු සමිතිය වෙත ලියාපදිංචි කර ගැනීමට කටයුතු කළ යුතුය.

18.11. දිවිනැගුම ප්‍රජා මූල බැංකු සමිතියක් තම බල ප්‍රදේශයේ ප්‍රජා මූල බැංකු වල ප්‍රගති සමාලෝචනයක් සිදුකරනු ලබන අවස්ථා වල ඒ සඳහා සංග්‍රහයක් ලබාදීමට රු.2500/- ක උපරිම මුදලකට යටත්ව වියදම් දැරීමට අනුමැතිය ලැබෙනු ඇත.දිවිනැගුම ප්‍රජා මූල බැංකු ප්‍රගතිසමාලෝචන සඳහා රු.5000/= ක සංග්‍රහවියදමක් දැරිය හැකි ය.

**19.** මෙම උපදෙස්වලට අමතර, තවදුරටත් අවශ්‍ය මඟපෙන්වීම් සමෘද්ධි බැංකු හා මහ සංගම් සඳහා දැනට ණය ක්‍රියාවලිය සම්බන්ධ නිකුත් කර ඇති උපදෙස් පරිශීලනය කරන ලෙසත්, එම උපදෙස් පරිදි සිදු කිරීමටත් කටයුතු කළ යුතු බවද දන්වා සිටින්නෙමු.

**20.** මෙම උපදෙස් හා මඟ පෙන්වීම්2014.11.01 දින සිට සියලුම දිවිනැගුම ප්‍රජා මූල බැංකු හා බැංකු සමිතිවල ක්‍රියාත්මක කිරීම සිදුවේ.

**21.** **වැඩිදුර තොරතුරු විමසීම.**

දිවිනැගුම ප්‍රජා මූල බැංකුවල හා දිවිනැගුම ප්‍රජා මූල බැංකු සමිතිවල ණය වැඩසටහන් පිළිබඳ වැඩිදුර තොරතුරු හා විමසීම් සඳහා ප්‍රජා මූල බැංකු අංශයේ නිලධාරි ගෙන් ලබාගත හැකිය.

දිවිනැගුම ජීවනෝපාය ජාතික වැඩසටහනට සමගාමීව ක්‍රියාත්මක කිරීමට යෝජිත දිවිනැගුම ප්‍රජා මූල බැංකු හා දිවිනැගුම ප්‍රජා මූල බැංකු සමිති ණය යෝජනා ක්‍රම සාර්ථක කර ගනිමින් ජාතික ආර්ථික සංවර්ධනය ක්‍රියාවලියන් වේගවත් කිරීම සඳහා ඔබ සැමගෙන් ලැබෙන සහයෝගය අගය කරමි.

ආර්.ඒ.ඒ.කේ. රණවක,
අධ්‍යක්ෂ ජනරාල්.

**පිටපත් :-**

1. ආර්ථික සංවර්ධන අමාත්‍යප ගරු බැසිල් රාජපක්ෂ මැතිතුමා - කා.දැ.ස.
2. සියලුම ආර්ථික සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමන්ලා - කා.දැ.ස.
3. සියලුම දිස්ත්‍රික් සම්බන්ධිකරණ කමිටු සභාපතිතුමන්ලා - කා.දැ.ස.
4. සියලුම ප්‍රාදේශිය සම්බන්ධිකරණ කමිටු සභාපතිතුමන්ලා - කා.දැ.ස.
5. ලේකම්, මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය - කා.දැ.ස.
6. ලේකම්, ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය - කා.දැ.ස.
7. ලේකම්, රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය - කා.දැ.ස.
8. සියලුම පළාත් සභා ප්‍රධාන ලේකම්වරු - කා.දැ.ස.
9. සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන් - කා.දැ.ස.
10. විගණකාධිපති - අ.ක.ස.
11. සියලු කලාප අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරුන් - කා.දැ.ස.
12. සියලු දිස්ත්‍රික් අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරුන් - කා.දැ.ස.
13. ප්‍රධාන ගණකාධිකාරිවරුන්, දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව - අ.ක.ස.
14. ප්‍රධාන අභ්‍යන්තර විගණක, දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව - අ.ක.ස.
15. සියලුම අධ්‍යක්ෂවරුන් , දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව. -අ.ක.ස.
16. සියලුම ප්‍රදේශිය ලේකම්වරුන්. - කා.දැ.ස.
17. සියලුම කලාප, දිස්ත්‍රික්, ප්‍රාදේශිය, දිවිනැගුම නිලධාරින්, බැංකු කළමනාකරුවන්සහවසම්භාරදිවිනැගුමනිලධාරින්. - අ.ක.ස.